# 2023 ජාතික අයවැය පිළිබඳ ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී එකමුතුවේ ප්‍රකාශය

නොවැම්බර් 14 වන දා ඉදිරිපත් කරන ලද රජයේ අයවැය ඇදහිය නොහැකි තරම් නිර්දය ය. ආර්ථික අර්බුදය හේතුවෙන් ශ්‍රී ලාංකිකයන් විඳදරාගන්නා දුක් වේදනා පිළිගැනීමට එය අපොහොසත් වේ. වත්මන් තත්ත්වය තුළ යථාර්ථවාදී නොවන ඉදිරි මාවත ලෙස අය-වැය කතාවේ සඳහන් වන්නේ ‘ශීඝ්‍ර ආර්ථික වර්ධනය’ සහ ‘ආර්ථික නවීකරණය ’ යි. බොහෝ ශ්‍රී ලාංකිකයන් කුසගින්නෙන් පෙළෙන අතර, අයවැය කතාවේ ඒ පිළිබඳව කිසිදු සඳහනක් නොවීය. අර්බුදයේ මානුෂීය බලපෑම අවම කිරීම සඳහා වන යෝජනා ප්‍රසිද්ධියේ ජනතාව කේන්ද්‍රගත විය යුතු මොහොතක, අයවැය පිළිබිඹු කරන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවගේ යථාර්ථයෙන් බරපතළ විසන්ධිවීමකි.

අපි 1970 ගණන්වල අග භාගයේ සිට පවතින ආර්ථික ප්‍රතිපත්තිවල අසාර්ථකත්වය පිළිගන්නා අතරම, ජනතාව වෙත සෘජුව දොස් පැවරීම ගැන කම්පාවට පත් වෙමු. අතීත සහ වර්තමාන ජන ජීවිතය පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් නොමැති බව පෙන්නුම් කරමින් අයවැය කතාවේ සඳහන් වන්නේ “අපි දවසින් දවස කම්මැලි වුණා. මිනිස්සු හැමදෙයක්ම රජයෙන් ලබාගන්න පුරුදු වුණා.” යන්නයි. එය වෙහෙස මහන්සි වී වැඩ කරන මිනිසුන් කම්මැලියන් ලෙස හුවා දක්වමින් ඔවුන් ආර්ථිකයට කරන දායකත්වය අපකීර්තියට පත් කිරීමකි. ලිබරල්කරණ ආකෘතියට මාරුවීම ශ්‍රී ලාංකිකයන් ලාභ ශ්‍රමය ලෙස සූරාකෑම සඳහා දුෂ්කර සේවා කොන්දේසි යටතේ රැකියාවලට තල්ලු කළ බව සිහිපත් කිරීම කාලෝචිත ය . ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඇත්තේ සහ නොනැසී පවතින්නේ, මෙම අසාධාරණ ශ්‍රම ක්ෂේත්‍රවල - ඇඟලුම්, සංක්‍රමණික ශ්‍රම සහ වතුකරයේ කම්කරුවන්ගේ, මූලික වශයෙන් කාන්තාවන්ගේ උරහිස් මත ය.

අද ශ්‍රී ලංකාවේ වැඩ කරන දුප්පතුන් මුහුණ දී සිටින අර්බුදයේ වගකීම භාර නොගැනීම ආණ්ඩුවේ නිහීන අසාර්ථකත්වයකි. අර්බුදය වැඩකරන ජනතාවට ප්‍රතිලාභ නොලබන ව්‍යාපෘති සඳහා විදේශ ණය ආයෝජනය කිරීම ඇතුළුව පාලක පන්තිය විසින් වසර ගනනාවක් තිස්සේ වැරදි ලෙස සංකල්පනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිවල සෘජු ප්‍රතිඵලයකි.

## කාන්තා ශ්‍රමය

යෝජිත අයවැය මගින් කාන්තාවන් මත පවතින අර්බුදයේ බර පිළිගැනීමට අපොහොසත් වන අතර එහි යොමුව ඇත්තේ ‘තරුණ කාන්තා ව්‍යවසායිකාවන්’ යන නොපැහැදිලි කාණ්ඩයට පමණි. දුක් මහන්සියෙන් උපයන මුදල් මෙරටට යැවීමට කාන්තාවන් දහස් ගණනක් සංක්‍රමණික සේවිකාවන් ලෙස පිටව යති. මේ අයවැයේ ඔවුන් සිටින්නේ කොහේ ද?

ක්ෂුද්‍ර මූල්‍ය ණය මත පදනම් වූ ව්‍යවසායකත්ව ආකෘතියක් දැනටමත් ගැඹුරු ගැටලුකාරී ලෙස ස්ථාපනය වී ඇත. වසර ගණනාවක් තිස්සේ, මෙම ණය නිසා දුප්පතුන්ව වීසි කර දමා ඇති පුළුල්ව පැතිරුණු සහ අතිමහත් වන ගෘහ ණය චක්‍රයට විසඳුම් ලබා දීමට මේ රට අපොහොසත් වී තිබේ. ක්ෂුද්‍ර මූල්‍ය ණයවලින් පීඩාවට පත් වූවන්, සිය දිවි නසාගත් ඇතැම් අය, මෙම ණයවල බිහිසුණු බව දීර්ඝ කාලීන විරෝධතා හරහා ප්‍රසිද්ධියට කර ඇත. මේ වසරේ කාන්තා හිංසනය ඉහළ යාම හඳුනා ගැනීමට ද අයවැය අසමත් වී ඇත. මෙම අර්බුදයේ බර දරා සිටින්නේ කාන්තාවන් වන අතර මෙම අයවැය මගින් ආර්ථික ප්‍රතිසාධනයේ බර ද සෘජුවම කාන්තාවන් වෙත පැවරීමට උත්සාහ කරයි.

## විරැකියාව

මේ වසරේ අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදිතයෙන් 10% කින් ආර්ථිකය සංකෝචනය වීම නිසා, පුළුල් ව පැතිරෙන විරැකියාව නොවැළැක්විය හැකියි. මතුවෙමින් පවතින විරැකියාවට විසඳුම, ව්‍යවසායකත්වයෙන් සහ විදේශ රැකියාවලින් නිරාකරණය කළ නොහැක. ඒ වෙනුවට දේශීය ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය සහ දේශීය කර්මාන්ත වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමටත් රාජ්‍ය සේවා ශක්තිමත් කිරීමටත් රජය කැපවිය යුතුය. එවැනි කැපවීමක් අයවැයෙන් පිළිබිඹු නොවේ.

තරමක් අඳුරු ගෝලීය ආර්ථික වාතාවරණයක් මධ්‍යයේ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම මත යැපීම අවදානම් සහගත ය. තවද, වැඩි ආර්ථික කලාප සඳහා වන සැලසුම්, විශේෂයෙන් කාන්තාවන් ඉලක්ක කර ගන්නා අස්ථිර ලාභ ශ්‍රමය ව්‍යාප්ත කිරීම් පිළිබඳ සංඥා කරයි. අපනයන සැකසුම් කලාපවල සේවා යෝජකයන් විසින් කම්කරු නීති නොසලකා හැරීම පිළිබඳව අපි හොඳින් දනිමු. කම්කරුවන්ගේ අයිතීන් සඳහා අනතුරු ඇඟවීමේ සීනු හඬවන තවත් කම්කරු ප්‍රතිසංස්කරණ අයවැය විසින් යෝජනා කර තිබේ.

## ආහාර සුරක්ෂිතතාව

මෑත කාලීන වාර්තා තුළින් ජනගහනයෙන් තුනෙන් එකකට ආහාර අනාරක්ෂිතභාවය ඇති බවත් 70% කට වඩා වන කුටුම්භ විසින් ආහාර ගැනීමේ පුරුදු වෙනස් කර ඇති බවත් අස්වැන්න 33.7% කින් අඩු වී ඇති බවත් (අවුරුදු 50 ක අඩු අගයක්) පෙන්වා දී තිබුණ ද මෙම අයවැයේ ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දී නොමැත. ආහාර නිෂ්පාදනය හා බෙදා හැරීමේ ක්‍රමය යථා තත්ත්වයට පත් කිරීමේ ශක්තිමත් සැලැස්මක් නොමැතිව අපිට බරපතළ ආහාර අර්බුදයෙන් ගොඩ ඒමට හැකියාවක් නැත.

මන්දපෝෂණයට ගොදුරු වීමේ අවදානමක් ඇති දරුවන් සඳහා පෝෂණ අතිරේක වෙන් කිරීම අයවැයේ පිළිගැනීමට ලක්වන අංගයකි. කෙසේ වෙතත්, ළමුන් අතර වාර්තා වන උග්‍ර මන්දපෝෂණය විසඳීමට එම මුදල ප්‍රමාණවත් නොවන බව අපි සටහන් කරමු. නිරාහාරව මිය යාමේ සැබෑ අනතුර සැලකිල්ලට ගෙන, අයවැයෙන් ආහාර බෙදා හැරීමේ ක්‍රමයක් සහ විශ්වීය පාසල් ආහාර වැඩසටහනක් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුව තිබුණි.

' ඌණ උපයෝජන ' සහ 'අසාර' ඉඩම් සම්බන්ධ අර්ථදැක්වීම, පසුගිය කාලයේ දුප්පතුන් සහ කම්කරුවන් අවතැන්වීම්වලට හා ඉවත් කිරීමට හේතු වීම පිළිබඳ අපි දැඩි සැළකිල්ළක් දක්වමු. 2021 වසරේ පොහොර තහනම සහ වියදම් වැඩි වීම ගොවීන් වගාව අත්හැරීමට හේතු වී තිබෙන බව අපි හොඳින් දනිමු. සුළු පරිමාණ ගොවීන්ට සහය වෙමින් තමන්ටත්, තම පවුලේ අයටත්, මුළු රටේම ආහාර අවශ්‍යතා සඳහාත් තිරසාර අනාගතයක් ගොඩනැගීමේ මාර්ගයක් ලෙස ගොවිතැන පුනර්වනය කිරීමේ හදිසි අවශ්‍යතාවක් පවතී . ඊට පටහැනිව, බහුජාතික සමාගම් විසින් ඉඩම් අත්පත් කර ගැනීම විධිමත් කිරීමට සහ සාධාරණීකරණය කිරීමට අයවැය මඟින් හැකියාව ලැබේ . මෙමගින් ගොවීන්, විශේෂයෙන්ම කාන්තාවන් දෛනික වැටුප් ලබන්නන් බවට පත් කිරීමෙන් ග්‍රාමීය ආර්ථිකයන් තවදුරටත් පිරිහීමට ලක්වන අතර ශ්‍රී ලංකාවේ ආහාර අවශ්‍යතා සපුරාලීම සඳහා වන තිරසාර විසඳුම් සෙවීමේ දී ප්‍රගතියක් නොලැබෙනු ඇත.

අයවැයෙන් භූමිතෙල් මිල සීඝ්‍ර ලෙස ඉහළ දැමීමෙන් දැඩි පීඩාවට පත්ව සිටින ධීවර ජනතාවට කිසිදු සහනයක් ලබාදී නොමැති අතර, ශ්‍රී ලාංකිකයන් යැපෙන ප්‍රධාන ප්‍රෝටීන් මූලාශ්‍රය අවිනිශ්චිත තත්ත්වයක පවතී. දශක ගනනාවක් තිස්සේ රාජ්‍යය විසින් නොතකා හරින ලද වතුකරයේ කම්කරුවන් නැවතත් අයවැයෙන් නොසළකා හැර ඇත.

## සමාජ ආරක්ෂණය

අයවැයෙන් යෝජනා කරන්නේ 'සමාජ ආරක්ෂාව සහ විවෘත ආර්ථිකය' යන නිරර්ථක ප්‍රවේශයකි. යෝජිත අයවැයේ සමාජ ආරක්ෂණ අයිතම දෙස බලන විට පැහැදිලි වන්නේ සමාජ ආරක්ෂණය පුළුල් කිරීමක් සිදු නොවන බවයි. දරිද්‍රතාවයේ සුවිශේෂ වැඩිවීම පිළිබඳ විශ්ලේෂණය සහ ජීවන වියදම මත උද්ධමනයේ බලපෑම පිළිබඳ පිළිගැනීමක් ඇත්තේ නැත. සැප්තැම්බර් මාසයේ අතුරු අයවැයෙන් පොරොන්දු වූ සහන, ලියාපදිංචි ප්‍රතිලාභීන් හට තවමත් ලැබී නොමැති බැවින් ප්‍රමාණවත් සහන නොලැබීම දෙස පවා බැලිය හැක්කේ සැකයෙන් පමණි. අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ලෙස හඳුනාගෙන ඇති විශේෂිත කාණ්ඩ සඳහා ලබා දෙන ඉතා සවල්ප සහන ප්‍රමාණයන් අයවැයේ  සඳහන් වේ. ජනගහණයෙන් අඩක් පමණ දරිද්‍රතාවයට ඇද වැටීමේ තර්ජනයට ලක්ව සිටින බවට ගතානුගතික පුරෝකථනයන් පවා පවතින විට සමාජ ආරක්ෂාව පිළිබඳ එවන් අතිශය සීමිත අවධානයක් ලබා දීම  තාර්කික නොවේ. මෙම දරුණු තත්වයන් තුළ විශ්වීය සමාජ ආරක්ෂණය පිළිබඳ සලකා බැලීමට අසමත් වීම මුළුමනින්ම පරතරයකි.

## අධ්‍යාපනය සහ සෞඛ්‍යය

කොවිඩ් -19 හේතුවෙන් පාසල් අධ්‍යාපනයට ඇති වූ ප්‍රධාන බාධාවන් සහ ඉන් පසුව ඇති වූ ආර්ථික අර්බුදය ගැන අයවැයේ සඳහනක් නැත. එය ඉගෙනීමේ අඩුපාඩුව ආමන්ත්‍රණය නොකරනවා මෙන් ම  බලපෑමට ලක් වූ සමස්ත පරම්පරාවකට උපකාර කිරීම සඳහා අධ්‍යාපනය සඳහා සැලැස්මක් ද යෝජනා නොකරයි. රජයේ රෝහල්වලට ගෙවන වාට්ටු හඳුන්වාදීමේ යෝජනාව දැඩි අවධානයට ලක්ව ඇත. අත්‍යාවශ්‍ය උපකරණ, යටිතල පහසුකම් සහ ග්‍රාමීය දිස්ත්‍රික්කවල පුහුණු කාර්ය මණ්ඩලවල හිඟකම වැනි රෝහල්වල පවතින භයානක තත්ත්වයන්ට පිළියම් යොදනවා වෙනුවට යෝජිත ගෙවන වාට්ටු මගින් දුප්පත්ම ජනතාව තවදුරටත් කොන් කරමින්,  ඉතිරි සීමිත සම්පත් මූල්‍යමය වශයෙන් දැරිය හැකි ජනතාවට වෙන් කරනු ඇත. මෙය  ක්‍රියාකාරී මහජන සෞඛ්‍ය පද්ධතියක් සහිත දකුණු ආසියාවේ එකම ජාතිය යන සාඩම්බර ගෞරවයෙන් මිදෙමින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය ක්‍රමයෙන් පෞද්ගලීකරණය කිරීමේ ආරම්භක පියවර බව අපි හොඳින් දනිමු .

ආරක්ෂාව සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනවලට සාපේක්ෂව අත්‍යවශ්‍ය අංශවලට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රජයේ ප්‍රමුඛතා ගැන පෙන්වා දෙයි. ආරක්ෂාව සඳහා අයවැයෙන් වෙන් කර ඇති මුදල රු. බිලියන 539ක් වන අතර, සෞඛ්‍යයට රු. බිලියන 322 ක් සහ අධ්‍යාපනයට රු. බිලියන 232 ක් වෙන් කර ඇත.

## ආදායම්

ආදායම් උත්පාදනය සඳහා රජය වක්‍ර බදු (වැට්) මත දැඩි ලෙස විශ්වාසය තබයි. වැටුප් වැඩි වීමක් පෙනෙන්නට නොමැති නිසා ඉදිරි වසර තුළ ජීවන වියදම ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපට අපේක්ෂා කළ හැකිය. යෝජිත බදු ක්‍රමයේ බර දරාගනිමින් ආර්ථික ප්‍රතිසාධනයට  උර දීම බලාපොරොත්තු වන්නේ සාමාන්‍ය ජනතාවගෙනි. ධන බද්දක් සඳහා කරන ලද ඉල්ලීම් නැසී ඇත.  අපි, ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී එකමුතුව ලෙස, සාමාන්‍ය පුරවැසියන්ගේ ජීවිත වඩාත් දුෂ්කර නොකර රජයේ ආදායම වැඩි කිරීම සඳහා ධන බද්දක් හරහා ප්‍රතිව්‍යාපී යුක්තිය ඉල්ලා සිටිමු.

## ආර්ථික ප්‍රතිසාධනය?

ආහාර අර්බුදයක් ඇතිවීම වැලැක්වීමේ ක්ෂණික මානුෂීය අවශ්‍යතා අයවැයෙන් විසඳා නැත. ජනතාව කේන්ද්‍ර කරගත් ආර්ථික ප්‍රතිසාධන වැඩපිළිවෙළක් ඉදිරිපත් කරන්නේ ද නැත . ඒ වෙනුවට, පෙර යුගයේ අසාර්ථක වූ ප්‍රතිපත්තිවලට ආපසු හරවා යවන අසංවිධිත ප්‍රතිපත්ති වට්ටෝරු යළි පණගන්වා ඇත. අයවැය විසින් සාමාන්‍ය ජනතාවට අර්බුදයේ බලපෑම ගැඹුරු කරනු නොඅනුමානය. මේ ජනතාව නැඟී සිට ආර්ථික සාධාරණත්වය ඉල්ලා සිටීමට කාලයයි.

*ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී එකමුතුව යනු, ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය සමඟ ඔවුන් වැඩ කරන ප්‍රජාවන්ගේ සජීවී යථාර්ථයන් මත පදනම්ව ප්‍රතිපත්ති නිර්දේශයන් අවබෝධ කර ගැනීමට, විශ්ලේෂණය කිරීමට සහ හඬ නැඟීමට 2022 අප්‍රේල් මාසයේදී එක් වූ රට පුරා සිටින ස්ත්‍රීවාදී ආර්ථික විද්‍යාඥයින්, විද්වතුන්, ක්‍රියාකාරීන්, විශ්වවිද්‍යාල සිසුන් සහ නීතිඥයින්ගේ එකතුවකි.)*

*(කරුණාකර ඔබගේ අදහස් එවන්න: feministcollectiveforjustice@gmail.com.)*